## ගම්පහ මහා නගර සභාව

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 31 දින නගරාධිපති ඇතුළු සභිකවරුන්ට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ගම්පහ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) විමධ්‍යගත හා පළාත් සභා ආධාර යටතේ නිමකළ ව්‍යාපෘති 09 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු රු.4,674,849 ක මුදලක් ණයගැතියන් යටතේ ඇතුලත්කර නොතිබුණි.

(ආ) පළාත් සභා ආධාර ව්‍යාපෘතියක වටිනාකම ඉක්මවා රු.1,585,437 ක් හිඟ ආදායම් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු ගබඩා තොග සත්‍යාපන ශේෂය වූ රු.8,369,662 ක් වෙනුවට රු. 8,567,764 ක් වූ තොග පාලන ගිණුමේ ශේෂය ගිණුම්ගතකර තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ආයතන 03 කින් ලැබී තිබූ ස්ථාවර වත්කම් වර්ග 04 ක වටිනාකම් තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි.

(ඉ) 2017 දෙසැම්බර් 31 දිනට වූ තොග සත්‍යාපනයට අනුව රු.86,548 ක හානි වූ තොග වටිනාකම ගිණුම් වලට ගලපා නොතිබුණි.

1.3.2 **නොසැසඳුණු ගිණුම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් විෂයයන් 2 කට අදාලව මූල්‍ය ප්‍රකාශන හා අදාළ උපලේඛන අතර රු. 3,087,138 ක වෙනසක් පැවතුණි.

(ආ) ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම හා ප්‍රාග්ධන යෙදුමට ආධාර මගින් දායකවීම යන ගිණුම්වල එකතුව හා ස්ථාවර වත්කම් ගිණුම්වල එකතුව අතර රු.2,102,447 ක වෙනසක් පැවතුණි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) **ලැබිය යුතු ගිණුම්**

(I) 2017 දෙසැම්බර් 31 දිනට පෙර ගෙවුම් ශේෂය වූ රු.8,091,962 කින් 2018 අගෝස්තු 15 දිනට රු.8,021,962 ක් අයකර ගැනීමට තිබුණි.

(II) 2008 නොවැම්බර් 28 දින ලැබුන රු.18,250 ක චෙක්පතක් අගරු වී තිබුණද, ඒ සඳහා 2018 අගෝස්තු 15 දිනටත් මුදල් අයකර නොතිබුණි.

(ආ) <u>ගෙවිය යුතු ගිණුම්</u>

සේවක ඇප ආයෝජන ගිණුමේ රු.13,500 ක මුදලක් වර්ෂ 06 කට පෙර සිට අඛණ්ඩව දක්වා තිබුණි.

1.3.4 <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම</u>

<u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම</u>

2016 ජනවාරි මාසයේදී රු.51,750 ක මුදලක් එක්තරා පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබූ නමුත් 2018 අගෝස්තු 15 දින වන විටත් ඒ සඳහා ප්‍රතිෂ්ඨාවක් සභාවට ලැබී තිබූ බවට සාක්ෂි නොතිබුණි.

1.3.5 <u>නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්</u>

නීති , රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1971 අංක 48 පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත | - | වරිපනම් බදු තක්සේරුව වර්ෂ 05 කට වරක් කරගතයුතු වුවද 2008 වර්ෂයෙන් පසු වරිපනම් තක්සේරු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) | මුදල් රෙගුලාසි 571 (2) | 17,148,718 | වර්ෂ 02 ඉක්මවූ තැන්පතු ශේෂය සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 756 (2) | | සමීක්ෂණ මණ්ඩල නිසිපරිදි පත්කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 756 (5) අ , ආ | | සමීක්ෂණ මණ්ඩල විසින් පාවිච්චි කළ යුතු පොදු ආකෘති භාණ්ඩ සමීක්ෂණ සඳහා භාවිතා කර නොතිබුණි. |

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.37,534,963 ක් වූ අතර. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.40,762,544 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 වර්ෂය | | | | 2016 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 64,566,458 | 64,640,457 | 65,825,622 | 44,533,775 | 63,657,500 | 63,062,050 | 62,648,459 | 45,354,444 |
| (ii) | කුලී | 30,502,956 | 37,312,145 | 22,866,353 | 27,875,217 | 23,560,250 | 22,745,096 | 21,111,864 | 13,392,325 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,517,800 | 4,522,214 | 4,504,214 | 286,225 | 4,364,250 | 3,828,358 | 3,837,508 | 268,225 |
| (iv) | වෙනත් ආදායම් | 272,216,844 | 260,215,722 | 274,118,325 | 201,486,626 | 387,965,880 | 338,170,804 | 278,016,434 | 215,389,229 |

2.2.2 **වරිපනම් හා බදු**

කාල විශ්ලේෂණයට අනුව 2017 දෙසැම්බර් 31 දිනට රු.34,081,661 ක් වූ හිඟ වරිපනම් හා බදු ශේෂය තුල වර්ෂ 10 ට වැඩි රු.2,055,751 ක්, වර්ෂ 5-10 අතර රු.11,707,321 ක්, වර්ෂ 2-5 අතර රු.10,353,664 ක් සහ වර්ෂ 1-2 අතර රු.9,964,924 ක් පැවතුණි. මෙම හිඟ ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.3 **ව්‍යාපාර බදු**

වර්ෂ 05 කට වැඩි කාලයක සිට හිඟව පවතින රු.442,650 ක ව්‍යාපාර බදු ශේෂයක් පැවති අතර මෙම හිඟ ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුලදී අයකිරීමක් සිදුකර නොතිබුණි.

2.2.4 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.10,966,320 ක් හා මුද්දර ගාස්තු රු.44,250,130 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්ය සාධනය**

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 32 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 18 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් 08 ක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත්කර නොතිබුණි.

(ඇ) <u>කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්</u>
පහත සඳහන් කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| කර්තව්‍ය | ඇස්තමේන්තු පිරිවැය | ආරම්භ කළයුතු දිනය | ආරම්භ කළ දිනය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|
| | රු. | | | |
| (i) යක්කල නැගෙනහිර වැරැල්ලවත්ත ප්‍රධාන මාර්ගයේ පොදු නාන ළිඳ සැකසීම | 154,596 | 2017/08/10 | ආරම්භ කර නැත. | අයහපත් කාලගුණය |
| (ii) අලුත්ගම්ගොඩ ගමට යන පාර සංවර්ධනය | 500,000 | 2017/08/10 | ආරම්භ කර නැත. | - |
| (iii) භූගෝලීය තොරතුරු පද්ධති තාක්ෂණ හා තොරතුරු තාක්ෂණය උපයෝගී කර ගනිමින් ගම්පහ මහා නගර සභාවේ කාර්යාලීය කටයුතු වල ධාරිතා සංවර්ධනය කිරීමේ වැඩසටහන | 1,000,000 | සඳහන් නොවේ | ආරම්භ කර නැත. | තොරතුරු රැස්කර ගැනීමේ ප්‍රමාදය |

(ඈ) <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>
මහා නගර සභා බල ප්‍රදේශයේ ජනනය වන කසළ, බල ප්‍රදේශයෙන් පිටත පිහිටි පෞද්ගලික ඉඩමකට බැහැර කිරීම සඳහා එම ඉඩම් හිමිකරු සමග ගිවිසුමකට ඇතුලත්වී තිබුණි. ගිවිසුම අනුව කසළ ටොන් 01 කට රු. 2,350 ක් ගෙවීමට එකඟ වී තිබුණද, සභාව විසින් කසළ බැහැර කිරීම ට්‍රැක්ටර් ලෝඩ් අනුව සිදුකර තිබුණි. ඒ අනුව සම්මත මිණුම් වෙනුවට අවිධිමත් ක්‍රමවේදයක් පදනම් කරගෙන හා ඉන්වොයිස් පත්‍ර ලබාගැනීමකින් තොරව 2017 වර්ෂයට අදාලව රු.10,786,500 ක් පෞද්ගලික ඉඩම් හිමිකරුට ගෙවා තිබුණි.

(ඉ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 අගෝස්තු 15 දින වන විටත් සකස්කර නොතිබුණි.

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>
පහත අවස්ථා නිරීක්ෂණය විය.

(අ) සභාව සතු තානායම් ඉඩමේ පිහිටි වෙළඳ සංකීර්ණය බදු දීමේ ගිවිසුමට අනුව 2017 සැප්තැම්බර් සිට 2018 ජනවාරි දක්වා වූ මාස 05 කට අදාලව අයවියයුතු මාසික බදු මුදල් රු.4,447,710 ක් බිල් කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පරිසර බලපත්‍ර වෙනුවෙන් අයකළ ගාස්තුව, බලපත්‍රය නිකුත්කළ දිනය, බලපත්‍රය භාරගත් බවට විස්තර ඇතුලත් කොට විධිමත් බලපත්‍ර ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

2017 වර්ෂය වෙනුවෙන් පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර 19 ක් හඳුනාගෙන තිබූ අතර බලපත්‍ර නිකුත්කර තිබුණේ ව්‍යාපාර 10 ක් වෙනුවෙන් පමණි.

3.3 **මානව සම්පත් කළමනාකරණය**

(අ) **සේවක පුරප්පාඩු හා අතිරික්ත**

2017 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ශ්‍රේණිය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 09 | 05 | 04 | - |
| තෘතීයික | 03 | 02 | 01 | - |
| ද්විතීයික | 112 | 126 | 09 | 21 |
| ප්‍රාථමික | 233 | 203 | 30 | - |
| | 357 | 336 | 44 | 21 |

නාගරික ගණකාධිකාරී තනතුරු 02 ක් අනුමත වී තිබුණද, එක් තනතුරක් 2013 ජනවාරි 01 දින සිට පුරප්පාඩු වී පැවතුණි.

(ආ) **සේවක ණය**

(i) ස්ථාන මාරුවී ගිය සහ විශ්‍රාම ගිය සේවකයින්ගෙන් අයවියයුතු වර්ෂ 15 ට වැඩි ණය ශේෂය රු.188,261 ක් වූ අතර වර්ෂ 5 ට වැඩි ශේෂය රු. 270,938 ක් විය.

(ii) සභාව සතු නිල නිවාසවල පදිංචි සේවකයන්ගෙන් අයවිය යුතු නිවාස කුලී රු.78,702 ක් සේවකයන් විශ්‍රාම යාම, මිය යාම හෝ ස්ථාන මාරුවීම යන හේතු මත වර්ෂ කිහිපයක සිට අය නොවී පැවතුණි.

3.4 **වත්කම් කළමනාකරණය**

3.4.1 **නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්**

2016 වර්ෂයේ සිට අබලි තත්ත්වයේ පැවති 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් විකිණීමට හෝ අළුත්වැඩියා කිරීමට නිර්දේශ කරන ලද ගල්රෝල, අබලි ටේලරයක් , මාර්ග කම්පන තලන 02 ක්, ජෙනරේටරයක් සහ තණකොළ කපන මැෂිමක් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතුකර නොතිබුණි.

3.4.2 **පවරා නොගත් වත්කම්**

2015 වර්ෂයේදී පළාත් පාලන අමාත්‍යාංශයෙන් නගර සභාව වෙත ලබාදී තිබූ රු.26,891,063 ක් වටිනා මෝටර් වාහන 03 ක් ගිණුමට ඇතුලත්කර තිබූ නමුත් අයිතිය නගර සභාවට පවරා ගැනීමට මෙතෙක් කටයුතුකර නොතිබුණි.

3.4.3 **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

(අ) ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධයෙන් ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට පුස්තකාල සමීක්ෂණ වාර්තාව අනුව රු.4,009 ක් වටිනා පොත් 34 ක් අස්ථානගතවී තිබූ අතර, භාවිතයට ගත නොහැකි රු.48,359 ක් වටිනා පොත් 308 ක්ද විය.

3.5 **කොන්ත්‍රාත් පරිපාලනය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) **සුරතල් මසුන් ඇති කිරීමේ ව්‍යාපෘතිය**

දිළිඳුකම පිටුදැකීමේ වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,000,000 ක ඉංජිනේරු ඇස්තමේන්තුවක් පදනම් කරගෙන සුරතල් මසුන් ඇතිකිරීමේ ව්‍යාපෘතියක් සිදුකර තිබුණි. මේ පිළිබඳව නිරීක්ෂණ පහත දැක්වේ.

(i) සකස්කර තිබුණු ඉංජිනේරු ඇස්තමේන්තුවට නිර්මිත සැලසුම් හා සම්මත මිනුම් ඒකක සඳහන් කිරීමකින් තොරව සංඛ්‍යා පමණක් යොදා තිබුණි.

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරු තෝරාගැනීමේදී 2012 ජනවාරි 05 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2012 පදනම් කරගෙන ප්‍රජා පාදක සංවිධාන සඳහා ඍජු කොන්ත්‍රාත් පැවරීමේ ක්‍රමය අනුව කටයුතුකර නොතිබුණි.

(iii) කොන්ත්‍රාත් ගිවිසුම අනුව ප්‍රතිලාභීන්ට මාළු ඇතිකරන සිමෙන්ති ටැංකි ඉදිකර දියයුතු වුවද ප්‍රතිලාභීන් 06 දෙනෙකුට ටැංකි ඉදිකරන අමුද්‍රව්‍ය පමණක් ලබාදී එක් ටැංකියකට රු.20,000 බැගින් ටැංකි 12 ට රු.240,000 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ආ) **යක්කල සාප්පු සංකීර්ණය ඉදිකිරීම**

2009 ජනවාරි 02 දින සිට මාස 09 ක කාලයක් තුල යක්කල සාප්පු සංකීර්ණය ඉදිකිරීම සඳහා පෞද්ගලික කොන්ත්‍රාත් සමාගමක් සමග ගිවිසුමකට එළඹ තිබූ නමුත් මෙම සාප්පු සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු 2018 අගෝස්තු 15 දින දක්වා අවසන්කර නොතිබුණි.

2009 අප්‍රේල් 09 දින සිට 2016 අගෝස්තු 08 දක්වා කාලය තුල සියයට 20 ක අත්තිකාරම් මුදලද ඇතුලත්ව කොන්ත්‍රාත් ආයතනයට රු. මිලියන 70.9 ක් ගෙවීම්කර තිබූ අතර 2017 දෙසැම්බර් 31 වන විට අත්තිකාරම් මුදලින් අයකරගෙන තිබුණේ මිලියන 12 ක් පමණි.

4. **පද්ධති හා පාලනය**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | (i) | වරිපනම් හා කඩකුලී තක්සේරු නොකිරීම. |
| | | (ii) | ඌන උපයෝජිත කඩකාමර පැවතීම. |
| | | (iii) | වරිපනම් බදු ප්‍රතිශත සංශෝධනය නොකිරීම. |
| (ආ) | අයවැය පාලනය | (i) | අයවැය ප්‍රායෝගික තත්ත්වයන්ට අනුකූල නොවීම |
| | | (ii) | අවිධිමත් පරිදි වැය විෂයයන් අතර මුදල් මාරුකිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | වත්කම් කළමනාකරණය | (i) | තොග මිලදීගැනීමේ හා නිකුත්කිරීමේදී ලේඛනවල ඇතුලත් නොකිරීම. |
| | | (ii) | භෞතිකව නොමැති වත්කම් ගිණුම් ගතවී තිබීම. |
| | | (iii) | වත්කම් වලට අදාල අයිතිය තහවුරු කිරිමට ඔප්පු හෝ පැවරුම් නියෝග නොතිබීම. |
| | | (iv) | ස්ථාවර වත්කම් ගිණුම් තැබීමේ ප්‍රතිපත්තියක් නොමැතිවීම. |
| | | (v) | ඉන්වෙන්ට්‍රි ලේඛන නොපැවැත්වීම. |
| ඇ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | (i) | කසළ වෙන්කර ලබාදීමට ජනතාව දැනුවත් කිරීම් ප්‍රමාණවත් නොවීම. |
| | | (ii) | කසළ බැහැර කිරීම සඳහා යන වියදම් අධිකවීම. |